**නාවික හා ගුවන්සේවා තොරතුරු හා පර්යේෂණ (පුද්) සමාගම - 2017**

---

නාවික හා ගුවන්සේවා තොරතුරු හා පර්යේෂණ (පුද්) සමාගමේ 2017 අගෝස්තු 02 දිනට ඇවර කිරීමේ ගිණුම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 අගෝස්තු 02 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ ඇවර කිරීමේ ගිණුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 පිහිටුවීම හා සමාගමේ අයිතිය**

---

2009 ජනවාරි 07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් ප්‍රකාරව ශ්‍රී ලංකා නැව් ඉඩ පහසුකම් වෙන්කිරීමේ කාර්යාංශය වෙනුවට නාවික හා ගුවන්සේවා තොරතුරු හා පර්යේෂණ ආයතනය යනුවෙන් නව ආයතනයක් ස්ථාපිත කිරීමට අනුමැතිය ලැබී තිබුණි. එසේම මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ මත පදනම්ව පාර්ලිමේන්තු පනතක් මගින් අධිකාරියක් ලෙස පිහිටවනු ලබනතෙක්, වරාය හා ගුවන්සේවා අමාත්‍යාංශය යටතේ වන රජය සතු සමාගමක් ලෙස පවත්වාගෙන යාමටත් අනුමත කර තිබුණි. ඒ අනුව 2009 ජූලි 14 දින නාවික හා ගුවන්සේවා තොරතුරු හා පර්යේෂණ (පුද්ගලික) සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය

කර තිබුණි. එසේම ශ්‍රී ලංකා නැව් ඉඩ පහසුකම් වෙන්කිරීමේ කාර්යාංශය ඇවර කර ඊට අයත්ව තිබූ රු.මිලියන 30 ක ස්ථාවර තැන්පතු ඇතුලු සියලුම වත්කම් මෙම සමාගම වෙත පවරා තිබුණි. ඒ අනුව රු.මිලියන 30 ක්වූ කොටස් ප්‍රාග්ධන හිමිකාරත්වය මහා භාණ්ඩාගාරය සතුව තිබුණි.

### 1.5 සමාගම ඇවර කිරීම

-----------------------

සමාගම 2012 වර්ෂයේ සිට අඛණ්ඩව අලාභ ලබා තිබීම, ආයතනය පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීමට අපොහොසත්වීම, නිශ්ක්‍රීයව පැවතීම හා ජාතික ආර්ථිකයට දායකත්වයක් ලබානොදීම යන කරුණු දක්වමින් වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයක් සලකා බලමින් 2016 අගෝස්තු 31 දින අමාත්‍ය මණ්ඩලය විසින් සමාගම ඇවර කිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව සමාගමේ වත්කම් විකුණා දැමීම, වගකීම් පියවීම හා සේවක වන්දි ගෙවා දැමීම ආදියෙන් අනතුරුව තවදුරටත් ඉතිරිව පැවති රු. 21,103,779 ක මුදල 2017 අගෝස්තු 02 දින මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි. එහෙත් 2007 අංක 07 දරන සමාගම් පනතේ XII වන කොටසේ සඳහන් ඇවර කිරීම සඳහා වූ ක්‍රියා පිළිවෙත් අනුගමනය කර නොතිබුණි.

### 1.6 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ඇවර කිරීමේ ගිණුම් ප්‍රකාශනවලින් 2017 අගෝස්තු 02 දිනට නාවික හා ගුවන්සේවා තොරතුරු හා පර්යේෂණ (පුද්ගලික) සමාගමේ ඇවර කිරීම් ගිණුම් ප්‍රකාශය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------------

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 ට අනුකූලව ඇවර කිරීමේ මූල්‍ය ප්‍රකාශන සමග මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාගමේ සමාලෝචිත කාලපරිච්ඡේදයේ අලාභය රු. 2,215,076 ක් විය. සමාගම අක්‍රියව පවත්වාගෙන යාම හේතුවෙන් ඇවරකිරීමේ දිනට සමුච්චිතව පැවති අලාභය රු.මිලියන 8.89 ක් වූ අතර එය ප්‍රකාශිත ප්‍රාග්ධනය වූ රු.මිලියන 30 ට ගැලපූ පසු රු.මිලියන 21.10 ක් දක්වා සියයට 29.63 කින් ප්‍රකාශිත ප්‍රාග්ධනයේ ඛාදනයක් සිදුවී තිබුණි.